2019. 10. 06 ලංකාදීප පිටුව 10

ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙන අභියෝග

ආචාර්ය අජිත් දිසානායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය
ajith@kln.ac.lk

... පසුගිය සතියෙන්

රාජ්‍ය මූල්‍ය හැසිරීම් පිරික්සීමේදී ද රටේ තිරසාර ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය සඳහා ඉතා දැඩි බාධකයක්ව පවතී. පසුගිය වසර කිහිපය තුළ රාජ්‍ය අය බාරය ඉතා බරපතළ ලෙස පිරිහීමත් රාජ්‍ය ණය ප්‍රමාණය ඉතිහාසයේ පෙර කිසි දිනක සිදු නොවූ අයුරින් ඉහළ නැඟීමත් මෙන්ම විදේශ ණය මත පමණක් රඳා පැවතීම හා දේශීය රාජ්‍ය සම්පත් විදේශ රටවලට අලෙවි කිරීමේ දැඩි අවශ්‍යතාවත් සර්ව ආර්ථික අස්ථායිතාව වර්ධනය කිරීමට ඉමහත් දායකත්වයක් දක්වා ඇත.

ශ්‍රී ලංකාව අනුගමනය කෙරෙන දුර්වල ආර්ථික කළමනාකරණ ප්‍රතිපත්ති හමුවේ රට තුළ සිදුකෙරෙන නියාමන ක්‍රියාවලිය ද දේශීය හා විදේශීය වශයෙන් ආයෝජකයන් දෙපාර්ශ්වයම අධෛර්යට පත් කිරීමකි. එහි බරපතළ බව තවදුරටත් වර්ධනය වෙනුයේ බොහෝ ආයෝජන ජංගම ඒවා වීම නිසා එකී ආයෝජන රට තුළ ස්ථාවර නොවී සාපේක්ෂව කලාපයේ ශක්තිමත් හා විශ්වසනීය ආර්ථිකයන් වෙත මාරුවීමේ ප්‍රවණතාවක් නිර්මාණය වීමෙනි.

ශ්‍රම හමුදාවේ නිපුණතා ව්‍යූහය තරගකාරී ගෝලීය ආර්ථික සමඟ සම්පාත නොවීමේ අභියෝගය ද සුළුවෙන් අහිතකර වෙන්නක් පමණක් නොව දේශීය ශ්‍රමය සඳහා ලැබෙන විදේශ ආදායම අනෙකුත් රටවලට සාපේක්ෂව පහළ අගයක් ගනු ඇත.

ගෝලීය තරගකාරී ආර්ථිකයන් හමුවේ රටේ යටිතල පහසුකම් ව්‍යූහයේ ගුණාත්මක භාවය දුර්වල තත්ත්වයක පවත්නා අතර ඒවායේ මිල ගණන් ද ඉතා ඉහළ අගයක් ගෙන ඇත. එමඟින් දේශීය මෙන්ම විදේශීය ආයෝජකයන් ද ආකර්ෂණය කර ගැනීමේ හැකියාව දුර්වල කෙරේ. මෙහිදී වඩාත් වැදගත් වන්නේ නව ආයෝජකයින් රට තුළට ගෙන්වා ගැනීම සහ පවත්නා ආයෝජන තවදුරටත් රඳවා තබා ගැනීමයි. එහෙත් දේශීය වශයෙන් බලශක්ති මිල ස්ථාවර මට්ටමක නොපැවතීම සහ දිනෙන් දින ඉන්ධන මිල ගණන් ඉහළ යාම ආර්ථික ස්ථායිතාව සඳහා පමණක් නොව සාධාරණත්වය කෙරෙහි ද අහිතකර බලපෑම් ජනිත කරවයි. ප්‍රවාහන හා ගමනාගමන වියදම් ඉහළ යාම පමණක් නොව ඒ සඳහා ඇති අවිශ්වාසනීයත්වය සමස්ත ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි සෘජු හා වක්‍ර වශයෙන් විවිධාකාරව අයහපත් බලපෑම් ජනිත කරවීම වැළැක්විය නොහැක්කකි.

අනෙක් අතට මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ වීමට පවත්නා ඉඩ ප්‍රස්ථා බාධාකාරී තත්ත්වයක් පෙන්නුම් කරයි. මෙම ස්වභාවය දේශීය හා විදේශීය ආයෝජන කෙරෙහි හිතකර නොවන්නකි. එමෙන්ම ව්‍යාපාර ක්ෂේත්‍රයේ ස්ථාවර නොවූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අහිතකර වෙන අතරම ස්ථාවර ව්‍යාපාරිකයින් ද අධෛර්යමත් කරවන්නකි. පෞද්ගලික ව්‍යවසායකයින් කෙරෙහි පූර්ණ විශ්වාසය තබා කටයුතු කෙරෙන ආර්ථික ප්‍රතිපත්ති අතර මෙකී ව්‍යාවරණය කිසි ලෙසකින්වත් සමගාමී නොවේ. එමෙන්ම රට තුළ විවිධාකාර බදු වර්ග ක්‍රියාත්මක කිරීම මඟින් ව්‍යාපාරිකයින් සහ පාරිභෝගිකයින් යන දෙපාර්ශ්වයේම විශ්වාසය පළුඳු වී ඇත. එකී තත්ත්වය සමස්ත ආර්ථිකයේ යහපැවැත්ම උඩු යටිකුරු කරවන්නක් බවට පත්ව ඇත. නීති විරෝධී ක්‍රම මඟින් මුදල් (කළු සල්ලි) ඉපයීම පමණක් නොව ක්‍රම විරෝධීව බදු දැලෙන් රිංගා යාම හා බදු ප්‍රතිපත්තියේ පවතින දුර්වලතා ආර්ථික වෘද්ධිය කෙරෙහි අහිතකර ප්‍රතිඵල උදා කෙරේ.

ආර්ථික වෘද්ධිය අත්පත් කරගත නොහැකි වීම

ආර්ථික වෘද්ධිය යනු රටක නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම වර්ධනය වීමකි. ඒ අනුව කාලයත් සමඟම මූර්ත ජාතික නිෂ්පාදිතයේ සහ ආදායමේ සිදුවන අඛණ්ඩ වැඩි වීමක් මඟින් රටක ආර්ථික වෘද්ධිය හඳුනාගත හැකිය. රටක ආර්ථික වෘද්ධියක දක්නට ලැබෙන මූලික ලක්ෂණ කිහිපයකි. ඒ යටතේ සම්පත් සම්භාරය ඉහළ යාම. එනම් භෞතික ප්‍රාග්ධනය, ස්වභාවික ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය සහ සමාජ ප්‍රාග්ධනය වැඩි වීම. එමෙන්ම ඵලදායිතාව ඉහළ යාම. එනම් තාක්ෂණික දියුණුව නව්‍යතාවන් බිහිවීම, පරේය්ෂණ සහ සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජන ඉහළ යාම. උසස් කළමනාකරණය මෙන්ම ආර්ථික ස්ථායිතාව එනම් මූලික සාර්ව ආර්ථික කොන්දේසි (Macroeconomic Fundamentals) හිතකර තත්ත්වයක පැවතීම. ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය වීම, බාධ වෙළෙඳාම සහ ආයෝජනය ආර්ථික සානුබල (ප්‍රෝත්සාහන) පැවැතීම, දේශපාලන හා සමාජීය ස්ථාවරත්වය, යහපාලනය තහවුරු කිරීම, මෙවැනි තත්ත්වයක් ශ්‍රී ලංකාව තුළ ඇතිකර ලීමට නොහැකි වීම ජාත්‍යන්තර තරගකාරීත්ව හමුවේ රට මුහුණ දෙන ප්‍රධානම ආර්ථික අභියෝගය බවට පත්ව ඇත.

ඌන සංවර්ධිත රටවල් ලෙස හඳුන්වන සංවර්ධනය වෙමින් පවත්නා රටවල දක්නට ලැබෙන දරිද්‍රතාව නම් භයානක ආර්ථික හා සමාජීය අර්බුදයට ආර්ථික වෘද්ධිය මඟින් සාර්ථක විසඳුම් ලබා දිය හැකි බව සංවර්ධන ආර්ථික විද්‍යාඥයින්ගේ මතයයි. ඔවුන් දක්වන ආකාරයට ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය නිසා සමාජයට ආර්ථික සෞභාග්‍යය සහ නව ආර්ථික අවස්ථාවන් බිහි කෙරේ. රැකියා අවස්ථාවන් පුළුල් වීමත් කුටුම්බ ආදායම් මට්ටම ප්‍රසාරණය වීමත් යන කරුණු නිසා තම දරුවන්ට යහපත් මෙන්ම උසස් අධ්‍යාපනයක් ලබා දීමට දෙමාපියනට ඇති ඉඩ ප්‍රස්ථාවත් පුළුල් වීම අනාගත ආයෝජනයක් වශයෙන් දක්වයි. ඒ අනුව ආර්ථික වෘද්ධිය යන්න එක් අතකින් ජනතාව තුළ කෙරෙන ධන ආයෝජනයක් ලෙස පෙන්වා දිය හැකිය.

සංවර්ධනය පිළිබඳ පවත්නා මතවලට අනුව විවිධාකාර සමාජ ආර්ථික පරිසරයන් තුළ ආර්ථික වෘද්ධිය දරිද්‍රතාව මත ඇති කෙරෙන බලපෑම් සාපේක්ෂව වෙනස් වේ. ආර්ථික වෘද්ධි කෙතරම් දුරට දරිද්‍රතාව අවම කිරීම සඳහා දායකත්වයක් දක්වන්නේ ද යන්න රඳා පවතිනුයේ එහි ප්‍රතිලාභ නිදහස්ව භුක්ති විඳීමට එරට දිළිඳු ජන කොටස්වලට අවස්ථාව උදා වී ඇති ද යන්න මතයි. එමෙන්ම ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට දිළිඳු ජන කොටස් කොතෙක් දුරට සහභාගි වන්නේ ද යන්න ද ඉතා වැදගත් වෙන්නකි. මක් නිසාද යත් හුදෙක් ආර්ථික වෘද්ධියේ ප්‍රමාණය පමණක් නොව වෘද්ධියේ ව්‍යාප්ති රටාව ද ඌන සංවර්ධිත රටවල පවත්නා දරිද්‍රතාව මැඩලීම සඳහා වඩාත් ප්‍රතිඵලදායක උපකරණයක් වන බැවිනි.

රටක ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ආර්ථික වෘද්ධිය බොහෝ විට එරට ආදායම් බෙදී යාමේ විෂමතාව වැඩි කිරීමට හේතු වෙන්නකි. 'සයිමන් කුෂ්නෙට්' නම් ආර්ථික විද්‍යාඥයා මෙම මතය පිළිගන්නා අතර ආර්ථික වෘද්ධියත් සමඟ කෙටි කාලීනව ආදායම් ව්‍යාප්ති විෂමතාව වැඩි වුවත් දිගු කාලීනව එය ක්‍රමයෙන් පහව ගොස් සාධාරණ පරිසරයක් නිර්මාණය වෙන බව ප්‍රායෝගික අධ්‍යයන ගණනාවක් මඟින් තහවුරු කර ඇත. ඉන් අදහස් වෙන්නේ කෙටි කාලීනව ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට දිළිඳුකම දුරැලීමට කළ හැකි බලපෑම් සාපේක්ෂව සීමා වුවත් දිගු කාලීනව හැකියාවක් පවත්නා බවයි.